# බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ සමාජයීය හා ආර්ථික වෙනස්වීම් 2

මීට ඉහත පරිච්ඡේදයේ දී ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීමේ සිට ඔවුන් මෙරට ගෙන ගිය පාලන කටයුතු පිළිබඳ කරුණු අධ්‍යයනය කළ බව ඔබට මතක ඇත. එම කාල පරිච්ඡේදය තුළ ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයේ ඇති වූ වර්ධනයන් හේතුකොට ගෙන දේශපාලන, සමාජ, ආගමික සහ සංස්කෘතික යනාදි සියලු ක්ෂේත්‍රවල පුළුල් වෙනස්කම් රැසක් ඇති විය. ඒ පිළිබඳව සාකච්ඡා කිරීම මෙම පරිච්ඡේදයේ අපේක්ෂාව යි.

16 වැනි සියවසේ දී පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණි විට ශ්‍රී ලංකාව තුළ දේශීය සම්ප්‍රදායට අනුව හැඩ ගැසුණු සමාජ ආර්ථික ක්‍රමයක් ක්‍රියාත්මක වෙමින් පැවතිණි. ආර්යයන් ශ්‍රී ලංකාවේ ජනවාස පිහිටුවාගත් ක්‍රි. පූ. 5 වන සියවසේ පමණ සිට ආරම්භ වූ සමාජ ආර්ථික ක්‍රමය කෘෂිකර්මය මත පදනම් වී තිබිණි. විදේශ වෙළෙඳාම ද පැවති අතර රජුගේ ප්‍රධාන ආදායම් මාර්ගය වූයේ ඉඩම් ය. රජුට අවශ්‍ය සේවා සපයමින් ජනතාව රටේ ඉඩම් භුක්ති වින්දහ. ජනතාව අතර මුදල් භාවිතයක් නොවූ අතර අභ්‍යන්තර වෙළෙඳාම භාණ්ඩ හුවමාරුව මගින් සිදු කෙරිණි. කුල ක්‍රමය පදනම් කොටගත් ආර්ථික ක්‍රමයක් පැවති අතර විවිධ කුලවලට අයත් ජනයා ඔවුනොවුන්ට අවශ්‍ය සියලු දෑ නිපදවමින් භාණ්ඩ හා සේවා හුවමාරුව මඟින් තම අවශ්‍යතා සපයා ගත්හ. ඒ අනුව ඔවුහු ස්වයංපෝෂිත ජීවිත ගත කළහ. 16 වැනි සියවසේ පෘතුගීසීන් පැමිණි අවධියේ දී ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් පැවති ආර්ථික ක්‍රමය, රාජකාරි ක්‍රමය, කුල ක්‍රමය, හා ඉඩම් මත පදනම් වූ ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමයක් ලෙස හැඳින්වීමට පුළුවන.

පෘතුගීසීන් මුහුදුබඩ ප්‍රදේශවල සිය බලය පිහිටුවා ගැනීමේ ප්‍රතිඵල වශයෙන් ශ්‍රී ලංකාවට ආවේණික ව පැවති සමාජ ආර්ථික රටාව ක්‍රමයෙන් වෙනස් වන්නට විය. ඔවුන්ගේ පාලන සමයේ දී වෙළෙඳාම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම නිසා ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතු ක්‍රමයෙන් අඩපණ විය. මේ නිසා මෙරටට අවශ්‍ය සහල් විශාල ප්‍රමාණයක් විදේශවලින් ආනයනය කිරීමට සිදු විය. මේ සමඟ ශ්‍රී ලංකාවේ මෙතෙක් පැවති ස්වයංපෝෂිත ආර්ථික රටාව බිඳ වැටී ගිය අතර ඊට මූලික අඩිතාලම පෘතුගීසීන් විසින් දමන ලද්දේ යැයි කිව හැකි ය.

පෘතුගීසීන් එළවා දමා ඔවුන් සතුව පැවති මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගත් ලන්දේසීන් යටතේ තවදුරටත් වෙළෙඳාම දියුණු වූ අතර පැරණි ස්වයංපෝෂිත ආර්ථික රටාව බිඳී යන්නට විය. ඒ සමඟ ම ලන්දේසීන් විසින් ආරම්භ කරන ලද සුළු කර්මාන්ත නිසා ඒවාට අවශ්‍ය සේවා සපයන කම්කරුවන් පිරිසක් ද බිහි විය. මේ නිසා මෙතෙක් පැවති අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය වෙනුවට වැටුපට සේවය කරන ශ්‍රමිකයෝ

පිරිසක් ද බිහි වුහ. ඒ අනුව මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසීන් යටතේ දේශීය ආර්ථික රටාව වෙනස් වී නව ආර්ථික රටාවකට පදනම වැටෙන්නට විය.

ලන්දේසීන් විසින් ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ක්‍රමානුකූලව වැවිලි වර්ග වගා කිරීම ආරම්භ කරනු ලැබී ය. ඔවුන් සතු ප්‍රදේශවල කුරුඳු වතු වගා කළ නමුත් ඒවා අසාර්ථක විය. ඊට අමතරව ලන්දේසීහු ගම්මිරිස් හා කරදමුංගු ගෙවතු වගාවන් ලෙස පුළුල් කිරීමට අනුබල දුන් අතර උක් සහ පොල් වගා කිරීම ද ආරම්භ කළහ. ආර්ථික කටයුතුවල දී පෘතුගීසීන් මෙන් ලන්දේසීහු ද එතෙක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වෙමින් පැවති අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය ප්‍රයෝජනයට ගෙන තම ආර්ථික කටයුතු සඳහා අවශ්‍ය ශ්‍රමය ලබා ගත්හ.

මුළු ශ්‍රී ලංකාවම අත්පත් කොට ගත් ඉංග්‍රීසීන් විසින් ක්‍රි.ව. 1833 න් පසුව මේ රටේ ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණ වල ප්‍රතිඵලයක් වශයෙන් ආර්ථික ක්‍රමයේ විශාල වෙනස්කම් ඇතිවන්නට විය. ආහාර සපයාගත් ගොවිතැන් කටයුතු වෙනුවට වාණිජ බෝග වගාව ආරම්භ විය. එමඟින් වතු වගාව ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන බලවේගය බවට පත් විය. ඒ සමඟ ම ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික ක්ෂේත්‍රවල පුළුල් වෙනස්කම් රාශියක් ඇතිවන්නට විය.

## රාජකාරි ක්‍රමය

ශ්‍රී ලංකාවේ දේශීය සමාජ ආර්ථික මෙන් ම දේශපාලන ක්‍රමයේ ද පොදු පදනම වූයේ රාජකාරි ක්‍රමය යි. එය ඉඩම් භුක්ති රාජකාරි ක්‍රමය සහ අනිවාර්ය සේවා රාජකාරිය යනුවෙන් අංශ දෙකකින් යුක්ත විය.

ඉඩම් භුක්ති රාජකාරි ක්‍රමය අනුව දිවයිනේ තිබූ සියලු ඉඩම් රජු සතු බව පිළිගැනිණි. රජුගේ ප්‍රධාන ආදායම් මාර්ගය වූයේ එම ඉඩම්වලින් ලැබුණු ආදායම යි. රට පාලනය කිරීමේ දී ඉටුකරන ලද විවිධ සේවාවන් වෙනුවෙන් එකල මුදලින් වේතන ගෙවීමක් නොවී ය. රජු ඔහුට අවශ්‍ය සේවාවන් සපයන නිලධාරීන්ට වේතන වශයෙන් ඉඩම් කොටස් ලබා දී තිබිණි. ඒවා "සේවා පරවේණි" නමින් හඳුන්වනු ලැබී ය. ඒ අනුව රජුගේ ඉඩම් භුක්ති විඳින ලද අය ඒ වෙනුවට රජුට විවිධ සේවා සැපයූහ. රජුගෙන් ඉඩම් ලබාගත් නිලධාරීහු ඒවා වගා කිරීම සඳහා සාමාන්‍ය ජනතාව වෙත බෙදා දුන්හ. එම ඉඩම් භුක්ති විඳි ඔවුහු රජයට සහ ප්‍රභූවරුන්ට විවිධ බදු වර්ග ගෙවූහ. ඉඩම් අයිතිය හා භුක්තිය සමඟ බැඳී පැවති එම ක්‍රමය ඉඩම් භුක්ති රාජකාරි ක්‍රමය වශයෙන් හඳුන්වනු ලැබී ය.

රාජකාරි ක්‍රමයේ අනෙක් අංශය වූයේ අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය යි. අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය යටතේ රටේ සිටි වැඩිහිටි පිරිමි සියලු දෙනා ම අවුරුද්දට නියමිත දින ගණනක් රජුට නොමිලයේ ශ්‍රමය සැපයිය යුතු විය. ගම්සභාව සහ ගම්මුලාදෑනිවරුන් යටතේ මේ සේවාවන් සැපයුණු අතර ඔවුන් ජීවත් වූ ගම්මානවල වැව්, අමුණු, ඇළවේලි, පාරවල් යනාදිය ප්‍රතිසංස්කරණය කිරීම වැනි පොදු කාර්යයන් සඳහා එම ශ්‍රමය යොදා ගැනිණි.

පෘතුගීසීන් හා ලන්දේසීහු ද ඔවුන්ගේ පාලන ප්‍රදේශවලදී අවශ්‍ය ශ්‍රමය ලබා ගැනීම පිණිස එකල පැවති අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය ප්‍රයෝජනයට ගත්හ. මෙම ක්‍රමයේ වෙනසක් සිදු කිරීමට පළමුවෙන් ම ප්‍රයත්න දැරුවේ 1796 දී මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කොට ගත් ඉංග්‍රීසීන් විසිනි. ඔවුහු සේවා සැපයීමෙන් හෝ භාණ්ඩවලින් හෝ වෙනුවට මුදලින් බදු ගෙවීමට නියම කළහ. අප ඉහත පරිච්ඡේදයේ ඉගෙනගත් පරිදි 1797 දී මුහුදුබඩ ප්‍රදේශවල ජනතාව ඉංග්‍රීසීන්ට විරුද්ධව කැරැලි ගැසීමට තුඩුදුන් ප්‍රධාන හේතුව වූයේ එම බදු ප්‍රතිසංස්කරණ යි.

## නෝර්ත් ආණ්ඩුකාරයා යටතේ රාජකාරි ක්‍රමය අවලංගු කිරීම

ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලයක් තිස්සේ ක්‍රියාත්මක වූ රාජකාරි ක්‍රමය අවලංගු කිරීමට විධිමත් පළමු පියවර තැබුවේ නෝර්ත් ආණ්ඩුකාරයා විසිනි. ඔහුගේ එම ක්‍රියාමාර්ගයට හේතු වශයෙන් දැක් වූ කරුණු කිහිපයකි.

01. දේශීය ප්‍රධානීන් ජනතාවගේ ශ්‍රමය සූරා කමින් පෞද්ගලික ප්‍රයෝජනය සඳහා එය යොදා ගැනීම,

02. නොමිලයේ සේවය ලබාගත් මෙම ක්‍රමය නිදහස් මිනිසුන්ට නොගැළපෙන වහල් ක්‍රමයක් ලෙස දිස් වීම,

03. දිවයිනේ සංවර්ධන කටයුතු සඳහා ශ්‍රමය ලබාගැනීමට තිබූ මහත් බාධාවක් ලෙස පෙනී යාම යනාදිය ඒ අතර ප්‍රධාන වේ.



රූපය 2.1
ෆ්‍රෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරයා

නෝර්ත් ආණ්ඩුකාරයා 1801- 1803 අතර කාලයේදී පනවන ලද පනත් තුනක් මඟින් රාජකාරි ක්‍රමය අවලංගු කෙළේ ය. ඉටු කරනු ලබන සේවයට මුදලින් වැටුප් ගෙවීමේ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. රාජකාරි ක්‍රමය අවලංගු කිරීමෙන් නෝර්ත් බලාපොරොත්තු වූ ප්‍රතිඵල නොලැබිණි. අලුත් ක්‍රමය යටතේ ආණ්ඩුවට පහසුවෙන් ශ්‍රමය ලබාගත හැකිවේ යැයි අපේක්ෂා කළ ද එමඟින් ආණ්ඩුවට විශාල අලාභයක් සිදු වූ අතර රාජකාරි ක්‍රමය යටතේ ලබාගත් තරමටවත් ශ්‍රමය ලබාගත නොහැකි විය. ස්වයංපෝෂිත ජීවිතයකට හුරු පුරුදු වී සිටි ලාංකික ජනතාවට මුදලේ වටිනාකමක් නොවී ය. මේ නිසා රාජකාරි ක්‍රමය අවලංගු කොට මුදලට ශ්‍රමය ලබා ගෙන විශාල ලාභයක් ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් නෝර්ත් ඇති කළ මෙම ප්‍රතිසංස්කරණ මුළුමනින් ම අසාර්ථක විය.

## මේට්ලන්ඩ් ආණ්ඩුකාරයා විසින් නැවත රාජකාරි ක්‍රමය ස්ථාපිත කිරීම

නෝර්ත්ට පසු 1805 දී ආණ්ඩුකාර ධුරය භාරගත් තෝමස් මේට්ලන්ඩ් රාජකාරි ක්‍රමය අවලංගු කිරීම සඳහා නෝර්ත් ගෙන ගිය ක්‍රියාකලාපය අනුමත කෙළේ නැත. එහෙයින් ශ්‍රමය ලබා ගැනීමටත් ආණ්ඩුවේ ආදායම වැඩි කොට ගැනීමටත් අවශ්‍ය පියවරක් වශයෙන් අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමට ඔහු කටයුතු කෙළේ ය. එසේ වුව ද ඔහු ඉඩම් භුක්ති රාජකාරි ක්‍රමය යළි ස්ථාපිත කෙළේ නැත.

රජයට සේවය කිරීම වෙනුවට මුදලින් වේතන ගෙවීමටත්, ඉඩම් භුක්තිය වෙනුවෙන් අස්වැන්නෙන් කොටසක් රජයට බදු වශයෙන් ගෙවීමටත් නෝර්ත් විසින් පනවා තිබූ විධිවිධාන මේට්ලන්ඩ් විසින් ද එලෙසම ක්‍රියාවේ යොදවන ලදී.

උඩරට රාජ්‍යයට අයත් ව තිබූ ප්‍රදේශ 1818 දී උඩරට ප්‍රකාශයට අනුව බ්‍රිතාන්‍යයන් යටතට පත් කොට ගත් පසු එම ප්‍රදේශවල ද ඉඩම් භුක්ති රාජකාරි ක්‍රමය අවලංගු කරනු ලැබී ය. ඒ වෙනුවට ඉඩම් බදු ක්‍රමයත් රාජ්‍ය සේවය සඳහා වේතන ගෙවීමේ ක්‍රමයත් ආරම්භ කෙරිණි.

## කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යටතේ අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අවලංගු කිරීම

ඉංග්‍රීසීන් ශ්‍රී ලංකාවෙන් ලබාගැනීමට අපේක්ෂා කළ තරම් ලාභ උපයාගත නොහැකි විය. ඒ වෙනුවට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව නඩත්තු කිරීමට අවශ්‍ය මුදල් බ්‍රිතාන්‍ය භාණ්ඩාගාරයෙන් වාර්ෂිකව ලබා ගැනීමට සිදු විය. එසේ ම වතුවගා කටයුතු සඳහා අවශ්‍ය ශ්‍රමය ලබා ගැනීම ද ගැටලුවක් විය. මේ හේතුන් නිසා රජය මුහුණ දී සිටි අයවැය හිඟය පියවා ගැනීම සඳහා ගතයුතු පියවර පිළිබඳව සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීමට 1829 අප්‍රේල් මාසයේ දී කෝල්බෲක් කොමිසම ශ්‍රී ලංකාවට එවී ය.

ශ්‍රී ලංකාවේ පැවති ඉඩම් භුක්ති ක්‍රමය, අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය, උඩරට හා පහතරට ක්‍රියාත්මක වූ විවිධ වගා ක්‍රම, විවිධ බදු ක්‍රම, විදේශිකයන්ට ඉඩම් අයිති කොට ගැනීමට තිබූ බාධා වැනි කරුණු පිළිබඳ තොරතුරු පරීක්ෂා කොට වාර්තාවක් ඉදිරිපත් කිරීම කෝල්බෲක් කොමිසමට පැවරී තිබූ කාර්යයන් විය. දිවයිනේ විවිධ ප්‍රදේශවල සංචාරය කරමින් තොරතුරු රැස්කළ කෝල්බෲක් රටේ ආර්ථික ක්‍රමය සහ පාලන ක්‍රමය පිළිබඳ වාර්තා දෙකක් ද අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය පිළිබඳ රහස්‍ය වාර්තාවක් ද ඉදිරිපත් කෙළේ ය. බැරිස්ටර්වරයකු වූ චාල්ස් හේ කැමරන් රටේ අධිකරණ කටයුතු ප්‍රතිසංස්කරණය කළ යුතු ආකාරය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කෙළේ ය.

අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අවලංගු කිරීම කෝල්බෘක් ගේ ප්‍රධාන යෝජනාවක් විය. ඔහු මෙම යෝජනාව ඉදිරිපත් කෙළේ පෞද්ගලික ව්‍යවසායකයන්ට බාධාවකින් තොරව අවශ්‍ය ශ්‍රමය ලබා දීමේ විධි විධානයක් වශයෙනි. එහෙත් එහිදී ඔහු අවධාරණය කෙළේ අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය හේතු කොට ගෙන ජනතාවට බොහෝ දුක් ගැහැට විඳීමට සිදු වන නිසා එම ක්‍රමය අවලංගු කළ යුතු බව යි. ඉංග්‍රීසීන් අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය ක්‍රියාත්මක කළ ආකාරය අනුව ගැමිජනතාවට තම පදිංචි ස්ථානවලින් දුර බැහැර ප්‍රදේශවල මාර්ග තැනීම වැනි බර වැඩ කිරීමට සිදු වූ අතර මේ නිසා ඔවුන්ගේ ගොවිතැන් කටයුතු පාළු විය. එබැවින් බොහෝ දෙනා රාජකාරි කටයුතුවලින් බැහැරව සැඟවී සිටි අතර දැඩි දඬුවම් පමුණුවා ඔවුන්ගේ ශ්‍රමය ලබාගැනීමට මුලාදෑනිවරුන්ට සිදු විය. එම තත්ත්වයන් යටතේ කෝල්බෘක් විසින් අමානුෂික ක්‍රමයක් ලෙස සැලකූ අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අවලංගු කළ යුතු යයි ඔහු යෝජනා කෙළේ ය.

ඒ අනුව එතෙක් ශත වර්ෂාධික කාලයක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ චිරාගත අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය 1833 දී අවලංගු කරන ලදී.


**ශිෂ්‍ය ක්‍රියාකාරකම**

- අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය යනු කුමක් දැයි හඳුන්වන්න.
- කෝල්බෘක් අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කළ යුතුයයි යෝජනා කිරීමට හේතු මොනවා ද ?

## වතු වගාවේ ආරම්භය හා ව්‍යාප්තිය

දහතුන් වැනි සියවසේදී පමණ ජලාශ්‍රිත ශිෂ්ටාචාරය බිඳවැටී රාජධානි නිරිත දිගට විතැන් වීමත් සමඟ ශ්‍රී ලංකාවේ පැවති කෘෂිකාර්මික ආර්ථික රටාව වෙනස් වී ක්‍රමයෙන් වාණිජ අර්ථ ක්‍රමයකට නැඹුරු වන්නට විය. මෙහිදී අපනයන වෙළෙඳ ද්‍රව්‍යයක් වශයෙන් කුරුඳු වැදගත් විය. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවලත් උඩරට ප්‍රදේශවලත් ඉබේ වැවුණු බෝගයක් වූ කුරුඳු වෙළෙඳාම රජුගේ ඒකාධිකාරයක් වශයෙන් පැවති අතර විවිධ විදේශීය වෙළෙඳුන්ට රජුගෙන් කුරුඳු ලබාගත හැකිවිය. 16 වැනි සියවසේ දී ශ්‍රී ලංකාවට පැමිණි පෘතුගීසීහු මුහුදුබඩ ප්‍රදේශ වල කුරුඳු වෙළෙඳාම තම ඒකාධිකාරය යටතට ගෙන විශාල ලාභ ලැබූහ. පෘතුගීසීන්ට පසු ව ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගත් ලන්දේසීහු ද කුරුඳු ඒකාධිකාරය තමන් සතු කොට ගෙන එමඟින් තම ආදායම වැඩි කර ගත්හ.

මුල් කාලයේ දී පෘතුගීසීන් මෙන්ම ලන්දේසීහු ද මෙරට වෙළෙඳ බෝග වගා කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය නො කළහ. එහෙත් වනාන්තරවල ඉබේ වැවුණු කුරුඳු ප්‍රථම වරට වතු වගාවක් වශයෙන් වගා කිරීමට ආරම්භ කෙළේ ලන්දේසීන් විසිනි. ඔවුහු මුලින්ම කුරුඳු ද පසුව කෝපි හා ගම්මිරිස් ද වාණිජ වැවිලි ලෙස ආරම්භ කළහ.



රූපය 2.2 කුරුඳු මිටි බැඳීම

වර්තමාන කොළඹ, කුරුඳුවත්ත, කදිරාන, ඇවරිවත්ත වැනි ප්‍රදේශවල කුරුඳු වගා කළ ලන්දේසීන් විසින් ශ්‍රී ලංකාවේ වතු වගා ආර්ථිකයේ මුල් පදනම දැමූ බව පෙනේ.

ලන්දේසීන්ගෙන් මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කොට ගත් ඉංග්‍රීසීහු මුල් කාලයේ සිට ම තම ආර්ථික තත්ත්වය දියුණු කර ගැනීමට කුරුඳු ඇතුළු විවිධ වෙළෙඳ බෝග වගාකිරීමට කටයුතු කළහ. වතු වගාව පුළුල් කිරීම දිරිමත් කිරීම සඳහා බදු ගෙවීමේ දී සහ ඉඩම් ලබා ගැනීමේ දී විවිධ පහසුකම් සැලසීම බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ ප්‍රතිපත්තිය විය.

එසේ වුව ද බ්‍රිතාන්‍යයන් අපේක්ෂා කළ පරිදි වතු වගාව ව්‍යාප්ත නොවූ අතර කුරුඳු වෙළෙඳාමෙන් ද ඔවුන්ට සතුටු විය හැකි ආදායමක් ලබාගත නොහැකි විය.

### කුරුඳු වෙළෙඳාම අඩපණ වීමට හේතු

- ඉන්දියාව, ජාවා වැනි රටවලින් ලන්ඩන් වෙළෙඳපොලට කුරුඳු වැඩි වැඩියෙන් ලැබීම,
- කුරුඳු වෙනුවට ගත හැකි කැසියා නැමති ද්‍රව්‍ය දකුණු ඉන්දියාව, පෙරදිග ඉන්දියා දූපත් හා දකුණු චීනය යන රට වලින් බහුලව ලබාගත හැකිවීම,
- කැසියාවල මිල අඩුවීම නිසා වැඩි දෙනෙකු ඒවා භාවිතයට ගැනීම,
- ශ්‍රී ලංකාව ඇතුළු නැගෙනහිර රටවලින් ලන්ඩන් වෙළෙඳපොලට යැවූ සෑම කුරුඳු රාත්තලකට ම තීරු බද්ද වශයෙන් සිලිං 3ක් ගෙවීමට සිදුවීම, බටහිර ඉන්දියා දූපත් වලින් යැවූ කුරුඳුවලින් අය කළ තීරු බදු ඊට වඩා අඩුවීම, මෙම තත්ත්වය යටතේ ශ්‍රී ලංකාවෙන් යැවුණු කුරුඳුවල මිළ ඉහළ මට්ටමක පැවතීම,
- මිළ ඉහළ මට්ටමක පැවතීමට අමතරව ලන්ඩන් වෙළෙඳපොලට ලැබුණ කුරුඳු ප්‍රමාණය ඉහළ යාම නිසා ශ්‍රී ලංකාව ඇතුළු නැගෙනහිර රටවල කුරුඳුවලට පැවති ඉල්ලුම පහත වැටීම යනාදී වශයෙන් දැක්විය හැකි ය.

## වතුවගාව පුළුල් වීමට තුඩුදුන් හේතු

1830 දශකය වනතෙක් බ්‍රිතාන්‍ය ආණ්ඩුව කොතරම් අනුග්‍රහ දැක්වුවත් වතුවගාව පුළුල්කොට ගත නොහැකි විය. එය ශීඝ්‍රයෙන් ව්‍යාප්තවීම ආරම්භ වූයේ 1835 පමණ කාලයේ සිට ය. එපරිද්දෙන් වතුවගාව පුළුල් වීමට තුඩුදුන් හේතු කිහිපයකි. කෝල්බෘක් කොමිසමේ නිර්දේශ පරිදි 1833 දී ක්‍රියාත්මක කළ ප්‍රතිසංස්කරණ ඒ අතර ප්‍රධාන විය.

කොල්බෘක් කොමිසම 1829 දී ලංකාවට පැමිණියේ බ්‍රිතාන්‍යයන්ට ශ්‍රී ලංකාවෙන් ලැබුණු ආදායමට වඩා විශාල මුදලක් ශ්‍රී ලංකාව පාලනය කිරීම සඳහා වැය වූ බැවින් එම අයවැය පරතරය පියවා ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ගයක් සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීමට ය.

ඒ පිළිබඳ සොයා බැලූ කෝල්බෘක්ට පෙනී ගිය පරිදි එවකට දිවයිනේ පැවති ආර්ථික ක්‍රමයේ ප්‍රධාන දුර්වලතාව වූයේ ආණ්ඩුව සතු වෙළෙඳ ඒකාධිකාරය යි. එම දුර්වලතාව මගහැරීම සඳහා පුද්ගලික ව්‍යවසායකයන්ට කිසිදු බාධාවකින් තොරව ආර්ථික කටයුතුවල නිරත වීමට ඉඩ ලබාදිය යුතු යැයි කෝල්බෘක් යෝජනා කෙළේ ය.

එකල පැවති බදු ක්‍රමය ද මහජනතාවට හිංසාකාරී වූ බවත් නිදහසේ ධනය ආයෝජනය කිරීමට බලාපොරොත්තු වන පුද්ගලික ව්‍යවසායකයන්ට බාධාවක් බවත් පෙන්වා දුන් කෝල්බෘක් එවක ක්‍රියාත්මක වෙමින් තිබූ බදු ක්‍රම ද සංශෝධනය කිරීමට යෝජනා කෙළේ ය.

විදේශීය ආයෝජකයන් ධෛර්යමත් කිරීම සඳහා කෝල්බෘක් විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ පරිදි 1833 දී ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණ වතුවගාවේ දියුණුවට බෙහෙවින් බලපෑවේ ය.

ප්‍රධාන ප්‍රතිසංස්කරණ කිහිපයක් පහත දැක්වේ

01. යුරෝපා ජාතීන්ට දිවයිනේ පදිංචි වීමට හා ඉඩම් අයිති කොට ගැනීමට තිබූ සීමාවන් ඉවත් කෙරිණි.

02. දේශීය හා විදේශීය ඕනෑම අයකුට කැමැති ප්‍රමාණයක් ඉඩම් ලබාගත හැකිවන අයුරින් රජයේ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තියක් ආරම්භ කෙළේය.

03. ආණ්ඩුකාරයාගේ බලතල අඩු කිරීම සඳහා විධායක හා ව්‍යවස්ථාදායක මණ්ඩල දෙකක් පිහිටු විය.

ව්‍යවස්ථාදායක, විධායක අධිකරණ ආදි සියලු ක්ෂේත්‍ර පිළිබඳ අසීමිත බලතල තිබූ ආණ්ඩුකාරයාට ඕනෑම පුද්ගලයකු රටින් පිටුවහල් කිරීම, නඩු විභාගයක් නැතිව සිරකර තැබීම වැනි පුළුල් බලතල ද පැවරී තිබිණි. එවැනි ආණ්ඩුකාරයකු යටතේ තම පුද්ගලික ධනය ආයෝජනය කිරීමට බ්‍රිතාන්‍ය ධන හිමියන් අකමැති වනු ඇති බව කෝල්බෘක් පෙන්වා දී තිබිණි. එහෙයින් විදේශීය ආයෝජකයන් මෙරට පදිංචි වීම සහ මුදල් ආයෝජනය කිරීම දිරිමත් කිරීම සඳහා ලිබරල්වාදී මුහුණුවරක් ගත් පාලන ක්‍රමයක් මෙරට පිහිටුවීම පිණිස ව්‍යවස්ථාදායක සහ විධායක සභා පිහිටුවී ය.

04. පෞද්ගලික ව්‍යවසායකයන්ට අවශ්‍ය ශ්‍රමය බාධාවකින් තොරව ලබාගැනීම සඳහා අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කරනු ලැබී ය.

05. අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය ශ්‍රම සංචලතාවට බාධාවක් නිසා වතු වගාව වැනි පෞද්ගලික ව්‍යවසායකයන්ට අවශ්‍ය ශ්‍රමය ලබාගැනීමට ඇති අපහසුතාවන් මඟ හැර ගැනීම මෙම ප්‍රතිසංස්කරණයේ අරමුණ විය.

පෞද්ගලික ව්‍යවසායකයන් මෙරට ධන ආයෝජනය අධෛර්යමත් කිරීමට බලපෑ බාධා 1833 සිට ක්‍රියාත්මක කළ ප්‍රතිසංස්කරණ හේතු කොට බොහෝ දුරට ඉවත් වූ බැවින් 1835 න් පමණ පසුව වතුවගාවේ ශීඝ්‍ර දියුණුවක් ඇති වන්නට විය.

06. පරිපාලන වියදම් අඩු කොට ගැනීම සඳහා මෙතෙක් සිවිල් නිලධාරීන් සතුව පැවති විශේෂ වරප්‍රසාද කීපයක් අවලංගු කරනු ලැබීමත් සමඟ එමඟින් සිවිල් සේවකයන්ට වන අලාභය පිරිමසා ගැනීම සඳහා ඔවුන්ට පෞද්ගලික ව්‍යාපාරවල යෙදීමට අවසර දෙන ලදී. එපරිද්දෙන් සිවිල් සේවකයින්ට ද පෞද්ගලික ව්‍යාපාරවල යෙදීමට ඉඩකඩ ලබාදීම වතුවගාවේ දියුණුවට තවදුරටත් හේතු වූයේ, ඔවුන් තම නිලබලය වතු වගාවේ ව්‍යාප්තියට තුඩුදෙන තත්ත්වයක් ගොඩ නැඟීමට යොදාගත් බැවිනි.

## කෝපි වගාව ව්‍යාප්ත වීම

බ්‍රිතාන්‍යයන් විසින් 1804 පමණ සිට කෝපි වගාව දියුණු කිරීමට උත්සාහ ගන්නා ලදී. එසේ වුවත් ස්වදේශිකයන්ට වතුවගා කිරීමට මූල ධනය නොමැතිවීම, යුරෝපීයයන්ට කොළඹ දිස්ත්‍රික්කයෙන් බාහිර ප්‍රදේශවල ඉඩම් මිලදී ගැනීම තහනම් කොට තිබීම, මුහුදුබඩ ප්‍රදේශවල කෝපි වගාවට සුදුසු ඉඩම් නොමැතිවීම වැනි කරුණු නිසා කෝපි වගාව ව්‍යාප්ත කළ නොහැකි විය.

පුද්ගලික ව්‍යවසායකයන් දිරිමත් කිරීමේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වීමත් සමඟ ශීඝ්‍රයෙන් දියුණුවට පත් වූයේ කෝපි වතු වගාවයි.

උඩරට ප්‍රදේශ බ්‍රිතාන්‍යයන්ට යටත් වීමෙන් පසු කෝපි වගාවට ඉතාමත් යෝග්‍ය භූමි ප්‍රදේශය ඔවුන් අතට පත් වීම කෝපි වගාවේ ශීඝ්‍ර දියුණුවක් ඇතිවීමට තුඩුදුන් ප්‍රධානත ම හේතුවක් විය.

- ප්‍රථම වරට 1822 දී ජෝර්ජ් බර්ඩ් නැමැත්තා ගම්පොළ සිංහපිටිය ප්‍රදේශයේ කෝපි වත්තක් ඇරඹී ය.
- 1824 දී එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරයා ගන්නෝරුවේ පුද්ගලික කෝපි වත්තක් ආරම්භ කෙළේ ය.
- ඔවුන් අනුගමනය කරමින් රජයේ නිලධාරීහු ද කෝපි වැවීම ආරම්භ කළහ.

- කෝපි වගාව සඳහා රජයේ අනුග්‍රහය ලබා දෙන ලදී. ඒ අනුව බාන්ස් ආණ්ඩුකාරයා 1825 දී කෝපි සඳහා අයකළ තීරු බද්ද ඉවත් කළ අතර වෙළෙඳ වැවිලිවලින් අයකළ බද්ද දොළොස් වසරකට නතර කෙළේ ය. එසේ ම වැවිලි කර්මාන්තයේ නියුක්ත කම්කරුවන් අනිවාර්ය සේවා රාජකාරියෙන් ද නිදහස් කෙරිණි. තවද ඔහු කෝපි වගාව සඳහා වැවිලිකරුවන්ට නොමිලේ කැලෑ ඉඩම් ලබාදීමට ද කටයුතු කෙළේ ය.
- 1830 පමණ වන විට ගාලු දිස්ත්‍රික්කයේ උඩුගම ප්‍රදේශයේ සහ දුම්බර මිටියාවතේ ද, ගම්පොළ හා පේරාදෙණිය අවට ප්‍රදේශවල ද කෝපි වතු ව්‍යාප්ත වෙමින් තිබිණි.

1837 න් පසු කෝපි වගාව ඉතා සාර්ථක වූ අතර ආණ්ඩුවේ නිලධාරීන් මෙන් ම විදේශිකයන් ද කෝපි වගාව ආරම්භ කළ අතර සුළු වශයෙන් ආරම්භ වූ කෝපි වගාව 1840 පමණ වනවිට උඩරට විශාල ප්‍රදේශයක ව්‍යාප්ත වී තිබිණි.

කෝපි වගාව ව්‍යාප්ත වීමත් සමඟ ඒ සඳහා අවශ්‍ය තරම් ඉඩම් ලබා ගැනීම අසීරු විය. යුරෝපීය වැවිලිකරුවන් සඳහා ඉඩම් ලබාදීම පිණිස 1840 අංක 12 දරණ මුඩුබිම් පනත පනවා උඩරට දේශීය ජනතාවට උරුම වීමට තිබූ ඉඩම් ඉතා අඩු මිලකට යුරෝපීයයන්හට විකිණීමට කටයුතු සම්පාදනය කෙරිණි. එමගින් ඉතා ලාභදායක මිලකට ඉඩම් ලබා ගත් විදේශීය ව්‍යාපාරිකයෝ පුළුල් ලෙස කෝපි වතු වගාව ආරම්භ කළහ.

### කෝපි වගාව දියුණු වීමට හේතු

- 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ යටතේ වතු වගාවට අවශ්‍ය ඉඩම් ලබාගැනීමට සහ යුරෝපීය මූලධනය මෙරටට ගෙන ඒමට පහසුකම් සැලසීම
- එංගලන්තයට කෝපි අපනයනය කිරීමේදී අයකළ තීරුබද්ද 1833 දී අඩු කිරීම
- වහල් මෙහෙය අවලංගු කිරීම නිසා බටහිර ඉන්දියා දූපත්වල කෝපි වගාව අඩපණ වීම සහ එමගින් මෙරට කෝපි සඳහා යුරෝපා වෙළෙඳපොලේ පැවති තරගය අඩු වීම
- 1837 පමණ වනවිට බටහිර ඉන්දියා දූපත් වල මෙන් අඩු වියදමකින් උසස් වර්ගයේ කෝපි ශ්‍රී ලංකාවේ ද නිපදවීමට හැකිවීම
- බෙල්ජියමේ හා ප්‍රංශයේ ජනයා අතර ද කෝපි පානය ජනප්‍රියවීම නිසා ඉල්ලුම වැඩි වීම

- බටහිර ඉන්දීය දූපත්වල කෝපි වතු පරිහානියට පත් වීමත් සමඟ ඒවායේ හිමිකරුවන් සුපුරුදු ව්‍යාපාරයක මුදල් ආයෝජනය කිරීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණ කෝපි වගාවට සම්බන්ධ වීම,
- අලුත් ව්‍යාපාරයක් වශයෙන් බටහිර ඉන්දියානු ක්‍රම අනුගමනය කරමින් සාර්ථක වැවිලි ක්‍රම අනුගමනය කිරීම,

  උදා :- ආර්.බී. බට්ලර් නැමැත්තා බටහිර ඉන්දියානු ක්‍රම හදාරා පැමිණ ඔහුගේ වැවිලි සඳහා ඒ ක්‍රම භාවිත කළ අතර අනෙක් වැවිලිකරුවෝ ද ඔහු අනුගමනය කළ හ.
- ලාභදායක ලෙස දකුණු ඉන්දියානු ශ්‍රමිකයන් ගෙන්වාගත හැකි වීම,
- කෝපි වගාවෙන් විශාල ලාභ ලැබිය හැකි වීම,
- බාන්ස් ආණ්ඩුකාරයාගේ පාලන සමයේ සිට කොළඹ වරාය සහ වතු වගාකළ ප්‍රදේශ ඒකාබද්ධ කළ මාර්ග ඉදි කිරීම නිසා ප්‍රවාහන පහසුකම් වැඩි දියුණු වීම යන ආදිය දැක්විය හැකි ය.

## කෝපි වගාවේ පරිහානිය

කෝපි වගාව 1837 සිට 1847 දක්වා වූ දස අවුරුද්ද තුළ ඉතා සීඝ්‍රයෙන් දියුණුවක් ලැබුව ද 1847 පමණ වනවිට කෝපි වතු ව්‍යාප්තියේ අඩපණ වීමක් දක්නට ලැබිණි. 1848 පමණ කාලයේ ඇති වූ ලෝක ආර්ථික පරිහානිය විවිධාකාර ලෙස මෙරට කෝපි වගාවට බලපෑම ඒ අවස්ථාවේ, කෝපි වගාව අඩපණ වීමට තුඩුදුන් ප්‍රධාන හේතුව විය.

එපරිද්දෙන් තාවකාලිකව කෝපි වගාව පරිහානියට පත් වුව ද නැවතත් 1853 පමණ වනවිට තත්ත්වය වෙනස් වන්නට විය. මුහුණ දීමට තිබූ ආර්ථික බාධක ඉවත් වී කෝපි භාවිතය නැවත මුළු යුරෝපය පුරා පැතිරී ගියේ ය. ලන්ඩන්හි කෝපි මිල ඉහළ ගොස් නැවත වැවිලිකරුවන්ට හොඳ ලාභයක් ද ලබාගත හැකි විය. එසේ වුවත් වැඩිකල් යාමට පෙර එනම් 1868 වන විට ''හැමීලියා වෙස්ට්‍රාට්‍රික්ස්'' නැමති දිලීර රෝගයක් වැළඳීම නිසා කෝපි වගාවේ පිරිහීම ආරම්භ විය. 1881 පමණ වනවිට කෝපි වගාව මුළුමනින් ම වාගේ පිරිහුණ අතර ව්‍යාපාරිකයන්ගේ අවධානය වෙනත් වගාවන් කෙරේ යොමුවන්නට විය.

## බහු වැවිලි යුගය

මෙම අවධිය තුළ වැවිලි වර්ග කිහිපයක් ම වගා කළ බැවින් බහු වැවිලි යුගය ලෙස ද හැඳින්වේ. කෝපි වගාව පරිහානියට පත් වෙමින් තිබූ සමය වනවිට සමහර වැවිලිකරුවෝ සිංකෝනා වගාව කෙරෙහි අවධානය යොමුකරන්නට වූහ. සිංකෝනා භාවිත කෙළේ ක්විනීන් නැමති ඖෂධය නිපදවීම සඳහා ය. 1878 පමණ වනවිට

සිංකෝනා වගාව අක්කර 65,000ක් පමණ ප්‍රමාණයක පැතිරී තිබිණි. මේ අතර ජාවා වැනි රටවල ද සිංකෝනා වගාව සිදු කෙරිණි. ඖෂධ පැළෑටියක් වූ එයට එතරම් පුළුල් ඉල්ලුමක් ඇතිවීමට ඉඩ නො තිබිණි. වැඩිකල් නොගොස් සිංකෝනා වගාව ද අත්හැර දමන්නට සිදු විය.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම**

- කෝපි වගාවේ වර්ධනයට හේතුවූ කරුණු විස්තර කරන්න.